# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2096/26 - 2018 නොවැම්බර් මස 07 වැනි බදාදා - 2018.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරියක වශයෙන් පත් කරන ලද ඛනිජ තෙල් සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරිය හට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාව ප්‍රකාරව පවරනු ලබන අමාත්‍යාංශය ද, එහි විෂයයන් හා කාර්යයන් ද නිශ්චය කර ඇති හෙයින්, 2018 නොවැම්බර් මස 07 වැනි දින සිට මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි එකී අමාත්‍යාංශයේ විෂයයන් හා කාර්යයන් ද, එකී අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන ද පවත්නා බව මවිසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 නොවැම්බර් මස 07 වන දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

1A - G 27791 — 372 (11/2018)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

**(1) ඛනිජ තෙල් සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතනයන් හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදුව, ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම
3. ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු
4. ඛනිජ තෙල් ගවේෂණය හා ඒ ආශ්‍රිත කටයුතු
5. ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් නිෂ්පාදනය හා බෙදාහැරීම
6. ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
7. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
8. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
2. සීමාසහිත ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්තය
3. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන කාර්යාංශය
4. සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්*

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත (1961 අංක 28)
- ඛනිජ තෙල් සම්පත් සංවර්ධන පනත (2003 අංක 26)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.